**රණවිරු සේවා අධිකාරිය - 2019**
**----------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

රණවිරු සේවා අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත

  විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනාගත සේවක වැටුප් වැඩිවීම, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කරගත යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවකයින් විසින් අවසාන වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන සේවකයින් 63 ක් සඳහා පාරිතෝෂිත ලෙස එකතුව රු.16,922,149 ක වෙන් කිරීම් සිදුකර තිබුණද පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා එපරිදි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | එවැනි ප්‍රතිපත්තියක් සකස් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව. | ප්‍රමිතයට අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී රු.473,448 ක ක්‍රමක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | එය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම සිදුකරන බව. | රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් මගින් මිලදීගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් ක්‍රමක්ෂය ගැලපිය යුතුය. |
| (ආ) භාවිතා නොකරන ලද රු 88,614 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | එය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම සිදු කරන බව. | ගොඩනැගිලි වටිනාකම නිවැරදිව ගණනය කර ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) භාණ්ඩාගාර බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.294,922 කින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | ඉහත අඩුපාඩු 2020 වර්ෂයේ ගිණුම් වලදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි පදනම් නියමයන්ට පටහැනිව නිෂ්කාර්යව පවතින රු.152,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක 4 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.96,946 ක ක්ෂය ගිණුම්ගත කර තිබුණි. | ආයතනයේ ප්‍රතිපත්තියක් අනුව ක්ෂය ගණනය කිරීම සිදුකර අවසන් ගිණුම් තුල ගිණුම් ගත කරන ලද බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව වත්කමක් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට ක්ෂය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මු.රෙ. 371 | කාර්යය නිමකල වහාම අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් 2014 වර්ෂය තුලදී නිලධාරින් දෙදෙනෙකුට අවස්ථා 5 කදී ලබා දී තිබුණු එකතුව රු.1,830,450 ක්වූ මුදල් අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින | මෙම අත්තිකාරම් ලබාදීමට අදාල සියලු ලිපි ගොනු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ භාරයට ගෙන විමර්ශනයක් සිදු කරගෙන යනු ලබන අතර, එම විමර්ශන කටයුතු මේ වන විටත් සිදුකෙරෙමින් පවතින බව. | මුදල් අත්තිකාරම් ලබාදීම සඳහාවූ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2.6 හා මුදල් රෙගුලාසි 756 | සෑම මුදල් වර්ෂයකම ජුනි මස 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2019 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි | 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කරමින් පවතින අතර, අදාල කාර්යය අවසන් වූ වහාම ඉදිරිපත් කරනු ලබන බව. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2002 මැයි 24 දිනැති අංක 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017, 2018 වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාගත කර නොතිබුණි. | 2017, 2018 වර්ෂයන්ට අදාල කාර්ය සාධන වාර්තා සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,424,207 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 22,447,903 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.36,872,110.61 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ වියදම් රු.25,407,720 කින් අඩුවී තිබීම හා ආදායම රු.11,464,390 කින් වර්ධනය වීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.11,464,390 කින් වර්ධනය වී තිබුණු අතර රජයේ පුනරාවර්තන දායකය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.20,609,831 කින් එනම් සියයට 5.3 කින් ඉහල ගොස් තිබීම මෙයට හේතුවී තිබුණි. එසේම ව්‍යාපෘති මෙහෙයුම් වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.15,064,052 කින් පහලයාම හා ගිවිසුම්ගත සේවාවන්ගේ පිරිවැය රු.4,984,585 කින් පහලයාම ප්‍රධාන විචලනයන් වශයෙන් හදුනාගෙන තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ ජංගම අනුපාතය 1:0.029 විය.සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් වලින් සියයට 70 ක් මුදල් හා මුදල් සමාන දෑ වලින් නියෝජනය වූයෙන් ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 ව්‍යාපෘති ප්‍රගතිය

------------------

රණවිරු සුභසාධනය සඳහා අධිකාරිය විසින්, 2015, 2016 සහ 2017 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු, වෛද්‍ය සායන සහ මනෝවිද්‍යාත්මක වැඩමුළු 2018 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂය තුලදී ද ක්‍රියාත්මක කර නොතිබුණි. මීට අමතර පසුගිය වර්ෂයේදී ක්‍රියාත්මක කෙරූ ආබාධිත රණවිරු වැඩමුළු පැවැත්වීම, හදිසි ආපදා ආධාර, කුසලතා ප්‍රවර්ධන, ස්වයං රැකියා ආධාර සහ ව්‍යවසාය සංවර්ධනය යන වැඩසටහන්ද සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක නොවුණි. එසේම මාපිය කැපකරු ශිෂ්‍යත්ව හා මා පිය සුරැකුම් දීමනා වැඩසටහන් වෙනුවෙන් දරා තිබුණු වියදම වාර්ෂිකව ක්‍රමයෙන් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආබාධිත රණවිරුවන් සඳහා ඉල්ලුම්කල රෝද පුටු, අත්වාරු , කෘතිම පාද , උපැස් යුගල් ප්‍රමාණය ඒකක 354 ක් 583ක් 472 ක් හා 165 ක් විය. එසේ වුවද සත්‍ය වශයෙන් ලබා දී තිබුණේ පිළිවෙලින් 25ක් 29ක් 9ක් හා 0ක් පමණි. එසේම මේ සඳහා අපි වෙනුවෙන් අපි අරමුදලින් රු.මිලියන 10 ක මුදලක් ලැබී තිබුණු නමුත් අවශ්‍ය කටයුතු කර නොතිබූ නිසා මෙම මුදල් 2019 දෙසැම්බර් 31 දින නැවත එම අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි. | වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 84.25 ක් වෙන් කරනු ලැබුවේ 2019 දෙවන අර්ධ වර්ෂයේ බැවින් නියමිත කාලය තුලදී ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වූ බව. | වෙන් වී ඇති ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල ගිණුම් හිමියන් දෙදෙනකු වෙත අවිධිමත් ලෙස රු.5,940,500 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් රු.4,978,500 ක් අයකර ගැනීම මේ දක්වා සිදුවී නොතිබුණි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇති අතර මේ වන විට එහි විමර්ශන කටයුතු සිදුකෙරෙමින් පවතින බව. | මෙවැනි කටයුතු නැවත සිදු නොවීමට පාලන පද්ධතිය විධිමත් කර සිදුවූ අලාභය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3.4** **අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වාර්ෂික ඇස්තමේන්තුව මගින් ආබාධිත රණවිරුවන්ට උපකරණ මිලදී ගැනීමට රු.2,700,000 ප්‍රතිපාදන වෙන්වී තිබුණු අතර රු.1,492,888 ක් පමණක් එනම් සියයට 55 ක් උපයෝජනය කර තිබුණි. එසේම ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන රු. 480,000 ක්ද උපයෝජනය කර නොතිබුණි. | 2019 වසර තුල ආරම්භ කරන ලද මෙම ප්‍රසම්පාදන කටයුතු වර්ෂය තුලදී අවසන් කල නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි වූ බැවින් කාර්ය සාධනය අඩු මට්ටමක පවතී. තවද ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන අදාල කාර්යයන් ඉටු කිරීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | වෙන්වී ඇති ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාපිය සුරුකුම් දීමනා වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් ජීවත්ව සිටීදැයි තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රතිලාභීන් 237 දෙනෙකු වෙනුවෙන් ලබාදුන් රු.17,550,489 ක් වසර 01 සිට වසර 10 ක කාලයක් නිෂ්කාර්යව තිබුණි. | ඉදිරි මාසයක කාලයකදී එම ප්‍රතිලාභීන් පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් සකස් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. |
| (ආ) ප්‍රතිලාභීන් මිය ගිය අවස්ථාවලදී හා රණවිරු වැටුපෙන් සියයට 25 ක දීමනාව ගෙවා තිබෙන අවස්ථා වල දී මා පිය සුරුකුම් ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන්ගේ ගිණුම් අවලංගු කර එම මුදල් අධිකාරිය වෙත නැවත ප්‍රේෂණය කර ගත යුතු වුවත් අවලංගු කළ යුතු ප්‍රතිලාභීන් 74 දෙනෙකුගේ ගිණුම්වල තිබුණු රු.2,493,756 ක් 2019 දෙසැම්බර් 31 දින විටත් නැවත අයකර ගෙන නොතිබුණි. | ඉදිරි මාසයක කාලයකදී එම ප්‍රතිලාභීන් පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් සකස් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. |
| (ඇ) අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ පිහිටි පරිත්‍යාග වශයෙන් ලැබුනු ඉඩමක් හා ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 10.1 ක් යොදවා ප්‍රතිසංස්කරණය කර බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් යොදා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් රු.මිලියන 26.7 ක් වටිනා | මෙම ඉඩමේ සහ අනෙකුත් දේපල ආරක්ෂා කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මාතර පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදා (3 වන ගැමුණු) කඳවුර වෙත භාර දෙන ලද බව. | පරිත්‍යාග ලෙස ලැබුණු මෙම වත්කම අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කිරීම අවශ්‍ය වේ. |

ඉඩම සහ ගොඩනැගිල්ල අනාරක්ෂිතව හා නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විරුසුමිතුරු ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පූර්ණ නිවාස 1464 ක හා අර්ධ නිවාස 1275 ක වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද 2019 වර්ෂ අවසන් වන විට වැඩ අවසන් කර තිබුණේ පූර්ණ නිවාස 195 ක් හා අර්ධ නිවාස 298 ක් පමණි. ඒ අනුව වසර තුනක් අවසන් වන විට පූර්ණ නිවාස සියයට 13 ක් හා අර්ධ නිවාස සියයට 23 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | මෙම ව්‍යාපෘති කාලය 2022 දක්වා දීර්ඝ කර ඇති බැවින් ඉදිරි වසර දෙක තුළදී නිවස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කරන බව. | අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |